Sinhalese | ඉංග්‍රීසි

තොරතුරු පත්‍රිකාව

# අබාධිත පුද්ගලයන් සඳහා ලියාපදිංචි වීමේ තොරතුරු

2023 අගෝස්තු



ආබාධිතතා සේවා භාවිතා කරන පුද්ගලයින්ට ආබාධිතතා සේවකයන්ගේ කුසලතා සහ විශේෂඥතාව සහතික කිරීම දුෂ්කර විය හැකිය. ආබාධිතතා සේවකයන් සියලු දෙනා සඳහා ම ආරක්ෂාව සහ නිපුණතාවය එකම ආකාරයකින් තක්සේරු නොකෙරේ.

ආබාධිතතා සේවකයන් ලියාපදිංචි කිරීමෙන් අරමුණු කරන්නේ ආබාධිතතා සේවාවන්හි ගුණාත්මක භාවය සහ ආරක්ෂාව වැඩිදියුණු කිරීම මගින් සමස්ත ආබාධිතතා සහිත ප්‍රජාවගේ ආරක්ෂාව වැඩි කිරීමයි.

## මා ලියාපදිංචි වූ ආබාධිතතා සේවකයෙක් තෝරාගත යුත්තේ ඇයි?

ආබාධිතතා සේවා භාවිතා කරන විට, අබාධිත පුද්ගලයින්ට ආරක්ෂිත සහ සවිබල ගැන්වෙන බව දැනීම වැදගත් වේ. සේවකයෙකු සහ ආබාධිත පුද්ගලයෙකු අතර ලොකු විශ්වාසයක් පවතින බැවින් සේවකයා ඇගයීමට ලක් කර ඇති බව කලින්ම දැනගැනීම මගින් ඉමහත් විශ්වාසයක් ඇති කරයි.

ආරක්ෂිත සහ දක්ෂ ආබාධිතතා සේවකයෙකු ලෙස ස්වාධීනව තක්සේරු කර ඇති ආබාධිතතා සේවකයෙකු තෝරා ගැනීමට ආබාධිත පුද්ගලයින්ට අයිතියක් ඇත.

ලියාපදිංචි ආබාධිතතා සේවකයන්ට ලියාපදිංචිය ලබා දීමට පෙර ඔවුන්ගේ පසුබිම, සුදුසුකම්, පළපුරුද්ද සහ කුසලතා තක්සේරු කර ඇත.

එයින් අදහස් වන්නේ ලියාපදිංචි ආබාධිතතා සේවකයෙකු තෝරා ගන්නා ආබාධිත පුද්ගලයින්ට තමන් ආරක්ෂිත තේරීමක් කරන බවට විශ්වාසය ඇතිකර ගත හැකි බවය.

ලියාපදිංචි ආබාධිතතා සේවකයෙක් තෝරා ගැනීම ඔබට ආරක්ෂිත සහ උසස් තත්ත්වයේ සේවාවන්ට වඩා හොඳ ප්‍රවේශයක් ලබා ගැනීමට උපකාරී වනු ඇත. එමෙන්ම සේවකයා පරීක්ෂාවට ලක් කර වගවීම දරන අයෙක් බව දැන ගැනීමට හැකිය. ඔවුන් අරමුදල් ලබා ගන්නා හෝ සේවයේ නියුක්ත වන ආකාරය කෙසේ වෙතත්, ලියාපදිංචි වික්ටෝරියානු ආබාධිතතා සේවකයන් ආරක්ෂිත, නිපුණ, සහ වෘත්තීය ලෙස කටයුතු කරන බව වික්ටෝරියාවේ නියාමකයා වන ආබාධිතතා සේවකයන් ලියාපදිංචි කිරීමේ මණ්ඩලය විසින් ස්වාධීනව නියාමනය කරනු ලැබේ.

සුදුසු සේවකයෙකු තෝරා ගන්නා විට, ඔවුන් ලියාපදිංචි වී ඇත්ද යන්න **www.vdwc.vic.gov.au** වෙතින් ආබාධිතතා සේවක නාමලේඛනය ඔස්සේ මර්ගගතව පරීක්ෂා කිරීම පහසු වේ.

## ලියාපදිංචි වීම සඳහා සේවකයන් කුමක් කළ යුතුද?

ලියාපදිංචි වීමට සහ එය පවත්වාගෙන යාමට අවශ්‍ය නම් අයදුම්කරුවන් විසින් සපුරාලිය යුතු ලියාපදිංචි ප්‍රමිතීන් තුනක් ඇත. ඒවා නම්:

**1. ඉංග්‍රීසි භාෂා නිපුණතාව**
ලියාපදිංචි වීමට නම්, ආබාධිතතා සේවකයන් ඉංග්‍රීසි භාෂාවෙන් කතා කිරීමට හෝ සන්නිවේදනය කිරීමට දක්ෂ විය යුතුය

**2. අපරාධ කටයුතු පිළිබඳ ඉතිහාසය**
අයදුම්කරුවන් වික්ටෝරියාවේ හෝ වෙනත් ස්ථානයක දී යම් වරදක් (වරදවල්) සම්බන්ධයෙන් වරද පිළිගෙන තිබේද හෝ වරදකරුවන් වී තිබේද, හෝ චෝදනා ඉදිරිපත් කර තිබේද හෝ වරදකරු බව ප්‍රකාශයට පත් කර තිබේද යන්න පිළිබඳව ඔවුන්ගෙන් විමසනු ලැබේ. අයදුම්පත ඇගැයීමට ලක් කරන අතරතුර අපරාධ කටයුතු පිළිබඳ ඉතිහාසය ගැන පරීක්ෂාවක් සිදු කරනු ලැබේ.

**3. අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය**
සියලුම ලියාපදිංචි සේවකයන් ලියාපදිංචි වර්ෂය තුළ පැය 10ක් අඛණ්ඩව වෘත්තීය සංවර්ධනය සම්පූර්ණ කළ යුතු අතර ඔවුන්ගේ ලියාපදිංචිය අලුත් කිරීමට අයදුම් කරන විට මෙම පැය ගණන් පිළිබඳ විස්තර සැපයිය යුතුය.

**ලියාපදිංචි ආබාධිතතා වෘත්තික විශ්වාසය නිරවද්‍ය බව සොයා බලන්න**

# වඩාත් අරක්ෂිත, ශක්තිමත් ආබාධිතතා අංශයක් ගොඩ නැගීමට උදව් කරන්න

## ලියාපදිංචි ආබාධිතතා සේවකයෙකු තෝරා ගැනීමට මට හැකි වේද?

ඔබට ආබාධිතතා සේවා සැපයීම සඳහා ලියාපදිංචි සේවකයන් තෝරා ගත හැකිය.

මෙයින් අදහස් කරන්නේ ආබාධිතතා සේවකයන්ට ආක්ෂිතව ක්‍රියා කිරීම සඳහා අවශ්‍ය දැනුම, කුසලතා සහ ගුණාංග ඇති බව දැන ගනිමින්, ඔබට සුදුසු වන ආබාධිතතා සේවකයෙකු තෝරා ගැනීමට ඔබට හැකි බවය.

## මට NDIS සැලසුමක් තිබේ නම්, ලියාපදිංචි ආබාධිතතා සේවකයෙකු ලබා ගැනීමට මට හැකිද?

ඔව්, ලියාපදිංචි සේවකයන්ට NDIS සේවා සපයන්නන් ඇතුළු සියලු වර්ගවල සංවිධාන තුළ වැඩ කළ හැකිය. නැතහොත් ඔවුන්ට ස්වයං රැකියාවක නිරත විය හැකිය.

ඔබේ ආබාධිතතා සේවකයා කුමන සේවා සපයන්නා සඳහා සේවය කරන්නේ ද, ඔවුන් තම සේවාවන් ප්‍රචාරය කරන්නේ කොතැනක ද හෝ ඔවුන්ගේ සේවාවන් සඳහා අරමුදල් ලබා ගන්නේ කෙසේද යන්න කුමක් වුවත්, වික්ටෝරියානු ආබාධිතතා සේවකයන් ආරක්ෂිත, දක්ෂ සහ වෘත්තීය ලෙස ක්රියා කරන බවට තක්සේරු කර ඇති බව ලියාපදිංචිය මගින් සහතික කරයි.

මෙයින් අදහස් වන්නේ ඔබේ NDIS සැලැස්ම හරහා ඔබට ලියාපදිංචි ආබාධිතතා සේවකයෙක් තෝරා ගත හැකි බවය.

## මට ලියාපදිංචි නොවූ ආබාධිතතා සේවකයෙක් තෝරා හැකිද?

ඔබට ලියාපදිංචි නොවූ ආබාධිතතා සේවකයෙක් තෝරා ගැනීමට හැකිය. වික්ටෝරියාවේ ලියාපදිංචි නොවූ සේවකයන්ට චර්යාධර්ම සංග්‍රහයකට අවනත වීමට සිදු වේ. වික්ටෝරියානු ආබාධිතතා සේවක කොමසාරිස්වරයා විසින් ලියාපදිංචි නොවූ ආබාධිතතා සේවකයන් නියාමනය කරයි.

සියලුම වික්ටෝරියානු ආබාධිතතා සේවකයන් ආබාධිතතා සේවා ආරක්ෂණ චර්යාධර්ම සංග්‍රහයට අවනත විය යුතු අතර මෙමගින් ආබාධිත පුද්ගලයින්ව හානිවලින් සහ අපයෝජනයන්ගෙන් ආරක්ෂා කිරීමට ප්‍රමිතියක් සපයයි.

මෙම සංග්‍රහය මගින් NDIS චර්යාධර්ම සංග්‍රහයට සමාන අවශ්‍යතා සඳහා අනුමැතිය ලබා දෙයි. මෙයින් අදහස් කරන්නේ ආබාධිතතා සේවකයන්ට NDIS හෝ වෙනත් සැපයුම්කරුවන් හරහා අරමුදල් සපයන්නේද යන්න නොසලකා, ඔවුන් සැමට සමාන අවශ්‍යතා අදාළ වන බවය.

## ආබාධිතතා සේවක නාමලේඛනය

සියලු ලියාපදිංචි ආබාධිතතා සේවකයන් **www.vdwc.vic.gov.au** වෙතින් ලබාගත හැකි වික්ටෝරියානු ආබාධිතතා සේවකයන් සම්බන්ධ පොදු නාමලේඛනයේ ලැයිස්තුගත කර ඇත. ඔබට ආසන්නයේ සිටින ලියාපදිංචි ආබාධිතතා සේවකයන් සොයා ගැනීම සඳහා ඔබට නාමලේඛනය වෙතින් සෙවීම් කළ හැකිය.

වෙබ් අඩවිය වෙතින් තහනම් නියෝගයක් නිකුත් කර ඇති වික්ටෝරියාවේ ආබාධිතතා සේවකයන්ගේ ලැයිස්තුවක් ද සොයාගත හැකිය.

## වික්ටෝරියාවේ ආබාධිතතා සේවක කොමිසම ගැන

වික්ටෝරියානු ආබාධිතතා සේවක කොමිෂන් සභාව, ආබාධිත පුද්ගලයින්ට වඩාත් හොඳින් ආරක්ෂා සැලසීම සහ ශක්තිමත්, ආරක්ෂිත ආබාධිතතා අංශයක් ගොඩනැගීම සඳහා පිහිටුවා ඇති ස්වාධීන ආයතනයකි. මෙම කොමිෂන් සභාව විසින් ආබාධිතතාසේවා ආරක්ෂණ චර්යාධර්ම සංග්රහය, ආබාධිත පුද්ගලයින්ට උපකාර කරමින් සිටින වික්ටෝරියාවේ සියලුම සේවකයන් සඳහා අවම අපේක්ෂාවන් ස්ථාපිත කිරීම, සහ පැමිණිලි සේවාව සඳහා වගකීම දරයි. පුද්ගලයින්ගේ ආරක්ෂාව අවදානමට ලක් කරන සේවකයන් විමර්ශනය කිරීමේ සහ තහනම් කිරීමේ බලතල සහිතව එයට පැමිණිලි සහ දැනුම්දීම් පිළිගත හැකිය.

අපගේ **vdwc.vic.gov.au** වෙබ් අඩවියට පිවිසෙන්න, නැතහොත් **1800 497 132** අමතන්න.
එමෙන්ම අපගේ **පුවත් හසුන සඳහා ලියාපදිංචි වන්න**

අපව අනුගමනය කරන්න,

**vdwc.vic.gov.au** වෙත පිවිසෙන්න,
1800 497 132 අමතන්න

Victorian Disability Worker Commission

VICTORIA State Government